# <u>නිවේදනය</u>

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම 2019(2020)

2024.09.27 දිනැතිව අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම 2019(2020) සඳහා එක් එක් විෂය යටතේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාමලේඛනය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කරන ලද කැඳවීම් ලිපි අයදුම්කරුවන් විසින් අයදුම්පත්වල සඳහන් කර ඇති ලිපිනයන් වෙත මේ වන විට යොමුකර ඇත. (කැඳවීම් ලිපියෙහි ආදර්ශ ආකෘතිය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයන් හා නියමිත වේලාවන් සඳහන් කල ලේඛනය මේ සමඟ දක්වා ඇත)

අදාළ දිනයන් වල දක්වා ඇති වේලාවන් වලදී කැඳවීම් ලිපියෙහි සඳහන් කර ඇති උපදෙස් ප්‍රකාරව සියළු ලේඛන සකස් කරගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වෙත පැමිණිය යුතුය. (තමාට නියමිත දිනට නියමිත වේලාව තුළ පැමිණීම අනිවාර්ය වේ.)

එදිනට කැඳවීම් ලිපියෙහි ශිර්ෂ I යටතේ සඳහන් සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද එම ලිපි ලේඛනයන්හි සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපී ගොනුවක් වෙනම ද ඉහත දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ අංකය සහ මණ්ඩල අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. (ලිපිගොනු කවරය සකස් විය යුතු ආකාරය දැක්වෙන ආකෘතියක් ද මේ සමඟ සඳහන් කර ඇත.) සියලුම සහතිකපත්‍ර/ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුය.

කැඳවීම් ලිපියෙහි අංක 06 යටතේ දක්වා ඇති ආකෘති පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර නියමිත දිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු අතර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු මෙම ආකෘති පත්‍ර පසු අවස්ථාවක ඉදිරිපත් කළහොත් බාර නොගන්නා බැවින් එය වෙබ් අඩවියෙන් බාගත කරගෙන කඩිනමින් සම්පූර්ණ කරවා ගැනීම අයදුම්කරුගේ වගකීමක් වේ.